# පුරාවිද්‍යා කැණීම් මගින් හෙළිවන ශ්‍රී ලංකාවේ බෞද්ධ ස්තූපවල ධාතු තැන්පත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනයක්

දර්ශන බණ්ඩාර[1]

මහාචාර්ය සුමනසිරි වාච්චගේ[2]

## හැඳින්වීම

විවිධ මූලාශ්‍ර ගත තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ඉතිහාසය දුරාතීතයක් දක්වා ගමන් කරයි. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට මෙරට ඉදිකරන ලද ස්තූප කිහිපයක් ගැන මූලාශ්‍රවල කරුණු දැක්වෙන අතර මහින්දාගමනයෙන් පසු ක්‍රමිකව විකාශයවෙමින් ස්තූප විශාල ප්‍රමාණයක් දිවයිනේ ගොඩනැගුණු බව පැහැදිලිව පෙනෙයි. ස්තූපයක් ඉදිකිරීම මගින් බලාපොරොත්තු වන ආගමික අරමුණු අතර ප්‍රමුඛ වන්නේ "ශරීරික ධාතු වන්දනයට" මූලිකත්වයක් ලබාදීමයි. එකී ශාරීරික ධාතු තැන්පත් කොට ඉදි කරන ලද චෛත්‍යය පිළිබඳ විවිධ විශ්වාසයන් මෙරට ජනතාව අතර පවතී. බුදුන්වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කරන ලද ථූපාරාමයේ සිට විවිධ ධාතූන් වහන්සේලා තැන්පත් කරමින් දිවයින පුරා ස්තූප ඉදි කළ බව මූලාශ්‍රවල දැක්වේ. නමුත් මෙම ධාතූන් තැන්පත් කරන ලද ආකාරය පිළිබඳව නිශ්චිත වැටහීමක් බෞද්ධ ජනතාව වෙත තවමත් නොපවතී. එම නිසා මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ ස්තූප ආශ්‍රිතව ධාතූන් තැන්පත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව කරුණු ගෙනහැර දැක්වීමට උත්සාහ දරණු ලැබේ. ඒ සඳහා 2013 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අම්පාර දිස්ත්‍රික්කයේ නීලගිරි ඉපැරණි ස්තූප ආශ්‍රිතව කරන ලද කැණීම් මගින් අනාවරණය කරගනු ලැබූ තොරතුරු සහ එම වර්ෂයේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාවාගල ස්තූපයේ සිදු කරන ලද කැණීම් ආශ්‍රිත සොයාගැනීම් පිළිබඳව අවධානය යොමු කෙරේ. එමගින් ශ්‍රී ලංකාවේ ස්තූප ආශ්‍රිතව ධාතු නිධන් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව පුරාවිද්‍යාත්මක සාක්ෂි අධ්‍යයනය කිරීම මෙම ශාස්ත්‍රීය සම්පාදනයෙන් අපේක්ෂිතය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ලද මූලික පර්යේෂණ ක්‍රමවේදය වන්නේ පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදයයි. අපගේ අධ්‍යයන ප්‍රදේශය වන නීලගිරි පරිශ්‍රය හා නාවාගල ස්තූපය ආශ්‍රිත හාත්පස මූලිකව ගවේෂණයක් සිදු කළ

---

1 කථිකාචාර්ය ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.

2 පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය.

අතර පසුගිය වර්ෂවලදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කළ කැණීම් පිළිබඳව අවධානය ද යොමු කරනු ලැබීය. විශේෂයෙන්ම 2013 වර්ෂයේදී අදාළ පුරා පරිශ්‍රවල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදු කරන ලද කැණීම් හා සොයාගැනීම් පිළිබඳ මෙහිදී අවධානය යොමුකරන ලද්දේ සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය මගිනි. අදාළ ක්ෂේත්‍ර අධ්‍යයනයේදී කැණීම් සිදුකරන ආකාරය සහ සොයාගන්නා ලද පුරාවස්තු කෙරෙහි විශේෂ අවධානය යොමු කරවීය. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ හා පර්යේෂණ ප්‍රකාශන මගින් නිපදවන ලද ස්ථූප තාක්‍ෂණය පිළිබඳව දැනුම මෙම පර්යේෂණය සඳහා ප්‍රයෝජනවත් විය. ස්ථූප තාක්‍ෂණය හා ධාතු පූජාවන් පිළිබඳ මූලාශ්‍රගත විස්තරාත්මකව ඇති දැනුම් පද්ධතිය පිළිබඳව අපගේ ගැඹුරු අවධානය මෙහිදි යොමු නොවේ. ප්‍රායෝගිකව ස්ථූපයක ඇති ධාතු නිධන් කිරීමේ ව්‍යවහාරය පිළිබඳ පුරාවිද්‍යා සාක්ෂි කෙරෙහි පමණක් දැඩි අවධානයක් මෙහිදී යොමු කරනු ලැබීය.

### අධ්‍යයන අරමුණු හා වැදගත්කම

ශ්‍රී ලංකාවේ පවතින විශාල ස්ථූප ඉදි කර ඇති අන්දම විශ්මය ජනක වූවද එකී තාක්‍ෂණය පිළිබඳව බොහෝ දෙනාගේ අවධානය යොමු නොවීය. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ ස්ථූපවල ධාතු නිධන් කිරීමේ ක්‍රමවේදයේ ප්‍රයෝගිකත්වය අධ්‍යයනයට පාත්‍ර කොට ඇත. නීලගිරි චෛත්‍යය සහ නාවාගල ආශ්‍රිත පුරා කැණීම් මගින් ලංකාවේ පැරණි ස්ථූප ඉදිකිරීමේ තාක්‍ෂණය හා කලාව පිළිබඳ ඉතා වැදගත් කරුණු කිහිපයක් හඳුනා ගැනීමට හැකි වීම, මෙම අධ්‍යයනයේ වැදගත්කම ඉහළ නැංවීය. මෙම කැණීම් ඇරඹීමට මත්තෙන් නීලගිරි චෛත්‍යය ගරා වැටී තිබූ ආකාරය කෙසේද යත් දුර සිට බැලූ තැනැත්තෙකුට දැඩි රක්ෂිත වනයක් ලෙස එය දිස්විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දැඩි පරිශ්‍රමයෙන් කාලයක් තිස්සේ මෙහි වැවී තිබුණු දැවැන්ත වෘක්‍ෂ ඉවත්කිරීමට හැකි විය. ඉන්පසුව මෙම ස්ථූපයේ ගර්භය, ඉහළ කොටස් සලපතල මළුව හා ක්‍රමානුකූලව කැණීමකට ලක් කරන ලද අතර පුරාවිද්‍යා කැණීම් අධ්‍යක්‍ෂ ආචාර්ය නිමල් පෙරේරාගේ මූලිකත්වය ඒ සඳහා ලැබී තිබුණි. මෙම කැණීම මගින් ස්ථූපයේ මුල් ස්වරූපය නැවත මතුකර ගැනීමට අවස්ථාව උදාවිය. එකී චෛත්‍යය අවධි තුනකදී විශාල කොට ඉදිකොට ඇතිබව ඉන් අනාවරණය විය. මුල් යුගයේ කුඩා ස්ථූපයක්ව පැවති නීලගිරිසෑය ඉන්පසුව විශාල කොට නැවත ඉදිකොට ඇත. නීලගිරියේ දෙවන කංචුකය විනාශ වූ පසුව නැවත වතාවක් තුන්වන වරටද නීලගිරිසෑය විශාල කොට ඉදිකරනු ලැබීය. මෙයාකාරයෙන්ම නාවාගල චෛත්‍යයද ගරා වැටී තිබූ අතර එහි කැණීම් මගින් එම ස්ථූපයද අවධි තුනකදී

නිර්මාණය වී ඇති බව හඳුනා ගන්නා ලදී. මෙම කැණීම් නීලගිරි හා නාවාගල චෛත්‍යය ලක්දිව ස්තූප ඉදිකිරීමේ තාක්‍ෂණය පිළිබඳව ඉතා වැදගත් සාක්‍ෂි කිහිපයක් හඳුනාගත හැකි විය. ස්තූපයක් ඉදිකළ පසුව එහි ස්වභාවය වන්නේ එය සංවර්ධනය කර නැවත නැවත ඉදිකිරීම මගින් එහි දිගුකල් පැවැත්ම ආරක්‍ෂා කිරීමයි. ඒ අනුව නූතනයේ දක්නට ලැබෙන බොහෝ ස්තූප අභ්‍යන්තරයේ තවත් කුඩා ස්තූප පවතින බවට ජීවමාන සාක්‍ෂියක් ලෙස ද නීලගිරිය හා නාවාගල ස්තූප වැදගත් වේ. මෙම අධ්‍යයනයේ වැදගත්කම වන්නේ නීලගිරි සහ නාවාගල ස්තූපවල ධාතු නිධන් කළ ක්‍රමවේද පිළිබඳ ශාස්ත්‍රීය කරුණු ගොඩනගා එහි ව්‍යවහාරික ඥානය සමාජගත කිරීමයි.

## නීලගිරි සහ නාවාගල ස්තූපවල ධාතු නිධානය කිරීමේ ක්‍රමවේද

ශ්‍රී ලංකාවේ ස්තූපවලට බෞද්ධයන් වන්දනාමාන කරනුයේ ඒවායේ තැන්පත් කර ඇති ධාතූන් වහන්සේලාට ගෞරව කිරීම උදෙසාය. ස්තූපයක් පිට සිට බැලූ පමණින් ධාතු නිධානයන් සිදු කර ඇති ආකාරය පැහැදිලි ව යමෙකුට අවබෝධ කරගැනීම පහසු නොවේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2011 - 2014 අතර සිදු කළ කැණීම්වලදී නීලගිරිසෑයේ ධාතු නිධන් කිරීමේ ව්‍යවහාරය පිළිබඳව වැදගත් සාක්‍ෂි ගණනාවක් ඉස්මතු විය.

I. ස්තූපයක අභ්‍යන්තරයේ ධාතු නිධන් කිරීම මෙන්ම සංවර්ධන කරන අවස්ථාවේදී ද ධාතු නිධන් කිරීම සිදු කළ බව හඳුනාගත හැකි විය.

II. විශේෂයෙන්ම ස්තූපයේ අභ්‍යන්තරයේ ඇති දෙවන කංචුකය වසා ඉදි කළ තුන්වන කංචුකයේ ධාතු නිධන් කිරීම පිළිබඳ තොරතුරු පුරාවිද්‍යා කැණීම්වලින් අනාවරණය වීය.

III. දෙවන කංචුකය විනාශ වීමෙන් පසුව තුන්වන කංචුකය (අවසන් නිමාව) ඉදිකිරීමේදී ධාතූන් තැන්පත් කිරීම සිදුකිරීම සඳහා ශක්තිමත් ගල්පුවරු භාවිතා කළ කුටි සකස් කර ඇති බව පැහැදිලිව නිරීක්‍ෂණය කළ හැකි විය.

IV. ගල්පුවරු වලින් සකස් කරන ලද කුටි ආශ්‍රිතව ධාතු නිධන් කිරීම සඳහා ධාතු කරඬු රනින් සහ පලිඟුවලින් නිම කරවන ලද්දේය.

V. ගල්මංජුසා තුළ ධාතු කරඬු තැන්පත් කොට පාත්‍රවල බහාලන ලද ධාතූන් ද එහි තැන්පත් කරන ලද්දේ ය.

VI. ගල් පියනකින් ශක්තිමත් කළ කුටිවල ඉහළින් අනුරාධපුර යුගයේ සිතුවම් ඇද තිබූ අතර ධාතූන් තැන්පත් කළ ස්ථානවල සුදුවැලි අතුරා ඇත.

VII. ධාතූන් තැන්පත් කළ කුටි වසා තුන්වන කංචුකය ඉදිකිරීමෙන් පසු ධාතූන් තැන්පත් කළ ස්ථාන හඳුනාගැනීමට විශේෂ ලක්‍ෂණ නොවීය.

VIII. නීලගිරි ස්තූපයේ එක හා සමාන උසකින් ධාතූන් තැන්පත් කළ කුටි ඉදි කොට ඇත.

IX. මෙම කුටිවල තැන්පත් කළ ධාතු කරඬු සංඛ්‍යාව එකිනෙකට වෙනස් බව පැහැදිලි ය.

X. ධාතූන් තැන්පත් කිරීමේදී සංවර්ධන අවධි නියෝජනය කළ රජවරු පවතින ස්තූපයේ අවසන් කංචුකය ආසන්නයේ ධාතු නිධන් කල බවත් ඊට පෙර යුගවල දී ස්තූපය අභ්‍යන්තරයේ ධාතු නිධන් කරන්නට ඇති බවත් පෙනෙයි. (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2013)

ඉහතින් සඳහන් කළ පරිදි නීලගිරි ස්තූපයේ ධාතු නිධන් කිරීමේ ව්‍යවහාරය ශ්‍රී ලංකාවේ ස්තූපයක ධාතු නිධන් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැදගත් පුරාවිද්‍යාත්මක සාක්ෂි පෙන්නුම් කරයි. බෞද්ධ ජනතාවගේ ධාතු වන්දනයට පාත්‍ර වන ස්තූප අභ්‍යන්තරයේ ධාතූන් තැන්පත් කිරීමේ නියම ස්වභාවය එයින් පැහැදිලි වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල ප්‍රදේශයේ, කටියාව ජනපදයේ නාවාගල චෛත්‍යයේ ධාතු නිධානය කිරීමේ ක්‍රම වේදය පිළිබඳව 2013 වර්ෂයේදී අධ්‍යයනයක නිරත වූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එය නීලගිරි චෛත්‍යයට සමාන ආකාරයෙන් පැවැති බව සොයාගනු ලැබීය. නාවාගල ස්තූපයේ විශේෂයෙන්ම ධාතු ගර්භයේ අභ්‍යන්තරයේ පහළ මට්ටමෙන්ද ධාතු නිධන්කොට තිබුණු බව ද හෙළිවීය.

**සමාලෝචනය**

ප්‍රස්තුත අධ්‍යයන මඟින් ශ්‍රී ලංකාවේ චෛත්‍යවල ධාතු නිධන් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව කරුණු විමර්ශනය කරන ලද අතර එහිදී රෝහණ දේශයේ අම්පාර දිස්ත්‍රික්කයේ නීලගිරිය සෑය සහ රජරට අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාවාගල ස්තූපය කෙරෙහි අවධානය යොමු කරවන ලදී. මෙම ස්තූපය අවධි තුනකදී ඉදිකොට ඇති බව පුරාවිද්‍යා නිලධාරීන් හඳුනා ගනු ලැබීය. මෙකී ස්තූප දෙකෙහි විනාශ වී ගිය තුන්වන හා දෙවන කංචුක අතර තැන්පත් කර තිබූ ධාතු ගර්භ කෙරෙහි විශේෂ අවධානයක් යොමුවිය. කාලයත් සමඟ ම විනාශ වී ගිය ස්තූපය නැවත ගොඩනැඟීමේදී ස්තූපයේ පිටත බිත්ති ආසන්නයේ කුටීර ඉදිකොට ධාතු තැන්පත් කිරීමේ ව්‍යවහාරය පිළිබඳ වැදගත් සම්ප්‍රදායන් පුරාවිද්‍යා කැණීම්වලින් අනාවරණය වූ අතර අපගේ අධ්‍යයනයට පාත්‍ර වූ ස්තූපවල ධාතු තැන්පත් කිරීමේ ව්‍යවහාරය අතීත ලංකාවේ ස්තූපවල ධාතු තැන්පත් කිරීමේ

ක්‍රමවේද හඳුනා ගැනීමට ප්‍රබල සාක්ෂියක් වන බව පෙනෙයි. දැනට සිදුකොට ඇති කැණීම් මගින් ගල් මංජුසා මත බහා තැන්පත් කළ රත්‍රං හා වීදුරු වර්ග වලින් කල ධාතු කරඬු හා ඒවායේ තැන්පත් කළ ධාතූන් හමුවිය. බෞද්ධ ආගමික සම්ප්‍රදායන් මත ධාතු වන්දනය සඳහා ජනතාව තුළ ඇති අභිචාරවල පසුබිම මෙකී ධාතු නිධන් කිරීමේ ව්‍යවහාරයෙන් පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ පෞරාණික ස්තූප ආශ්‍රිත ධාතු පූජාවන් හා ඒවා තැන්පත් කිරීමේ ව්‍යවහාරය හඳුනා ගැනීම සඳහා නීලගිරිය සහ නාවාගල කැණීම් වැදගත් සංධිස්ථානයක් ලෙස සැලකිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මහාවංසො,* 1959, පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්කරණය, කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම.

Somadewa, Raj. 2012. *Nilgiriseya Survey 2011*. Colombo: a PGIAR Publication.

Horcart, A.M. 1930. "Archaeological Summary" *In Ceylon Journal of Science Section G - Archaeology, Ethnology,* Etc. Vol. II. Part I. London.

Nicholas, C.W., 1959. Historical Topography of Ancient and Mediaeval Ceylon. In *JRASCB NS VI* 1959. London.

Paranavitana, S. 1946. *The Stupa in Ceylon.* Memoirs of the Archaeology gical survey in Ceylon. Vol V. Colombo.

*ථූපවංශය* (1990)., සංස්.වටද්දර ධම්මකිත්ති, නුගේගොඩ - ඇන්.ජේ. කුරේ හා ඇන්.ඊ. කුරේ. සමාගම.